**තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාර්ය**

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 3</u>

1983 ජූලි කලබල හේතුවෙන් අවතැන්වූ ජනතාවට ප්‍රදානය කරන ලද රු.10,000 බැගින් වූ ස්වයං රැකියා ණය ශේෂයන් රු.8,642,952 ක්ද, රු.25,000 බැගින් වූ දෙපල යථාවත් කිරීමේ ණය මුදල් රු.67,341,609 ක් ද, ගිණුම් වලින් කපා හැරීමට මූලික පියවර ගෙන ඇති නමුත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 3 ට අනුව ගිණුම් සටහන් මගින් හෙලිදරව් කර නොතිබුණි.

(ආ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18</u>

ශේෂ පත්‍රයේ රු.6,552,490 ක සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්වූ ස්ථාවර වත්කම් පෙන්වා ඇති අතර, එම ස්ථාවර වත්කම් මොනවාද යන්න භෞතිකව හඳුනාගෙන නොතිබුණි. ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත්, ප්‍රයෝජනයට ගත හැකි වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් මෙම වත්කම් සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24</u>

වත්කම් වලට අදාල රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36

2008 ඔක්තෝබර් 06 දින සේවය හැර ගිය නිලධාරිනියකට හිමි රු.87,725 ක පාරිතෝෂිත දීමනාව කම්කරු දෙපාර්තමේන්තුවේ ගිණුමක 2009 ජූලි 25 දින තැන්පත් කර ඇති අතර මෙය අසම්භාව්‍ය බැරකම් ලෙස ශේෂ පත්‍ර සටහන් වල නිරූපනය කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට වාහනවල වටිනාකම රු.6,668,570 ක් වන බැවින් අධිකාරියේ වාර්ෂික ක්ෂය අනුපාතය අනුව ක්ෂය අගය රු.1,667,142 ක් විය යුතු වුවත් රු.1,677,142 ක් ලෙස ක්ෂය ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම් රු.10,000 ක් වැඩියෙන් පෙන්නුම් කෙරිණි.

(ආ) පිරිවැය රු.293,000 ක් වූ වත්කම් ඉවත් කර තිබූ අතර එවායේ පොත් අගය රු.8,689 ක් විය. ඒවා සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති ලෙස සලකා ගිණුම් ගැලපීම හේතුවෙන් වත්කම් ඉවත් කිරීමේ ලාභය රු.8,689 ක් වැඩියෙන් පෙන්නුම් කෙරිණි.

1.2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නාවික, වරාය, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ 1994 පෙබරවාරි 05 දිනැති අංක එම්ආර්ආර්/7/1/48/94 දරන චක්‍රලේඛය | විවාහයෙන් පසුව ජීවිකාව ඇරඹීමට රු.25,000 ක ආධාරයක් ලබා දිය හැකි වුවද, අවතැන්වූවන් දෙදෙනෙකුට චක්‍රලේඛයට පටහැනිව ආධාර මුදලින් අඩක් පමණක් ගෙවා තිබුණි.<br>විවාහ සමෘද්ධි දීමනාව ගෙවීමේදී එහි නියම ප්‍රතිලාභය ලැබීමට විවාහ වූ කාල සීමාවේදී ලැබිය යුතු වුවත්, විවාහ වී වසර 10 ක් 15 ක් වැනි කාලයක් ඉක්මවා ගිය පසුවද සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිලාභ ලබාදී තිබූ බව නිරීක්ෂණය විය. |
| (ආ) 2003 ජූලි 24 දිනැති අංක 112 දරන ජාතික අයවැය චක්‍රලේඛය | නිසි අනුමැතියකින් තොරව සම්බන්ධීකරණ නිලධාරියකු වෙත කුලී වාහනයක් භාවිතා කිරීම වෙනුවෙන් රු.156,000 ක මුදලක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ යෙදවීමේදී ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත් 2010 ජූලි සිට දෙසැම්බර් දක්වා සේවය කරන ලද විශ්‍රාමික නිලධාරියකු වෙත ජීවන වියදම් දීමනා ලෙස රු.15,750 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 2008 ජනවාරි 01 දිනැති අංක 1530/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය | රු.25,000 ට වැඩි මුදලක් හෝ වෙනත් දේපලක් සඳහා දෙන ලද ලදුපතක් වෙනුවෙන් මුද්දර ගාස්තු අයකර නොතිබුණි. |
| (ඉ) <u>ශ්‍රී ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහය</u> | |
| (i) V පරිච්ඡේදයේ 2.5.3 වගන්තිය | ද්විතියන පදනම මත සේවය කරන නිලධාරියාගේ වැටුපෙන් 25% ක් අයකර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට යැවිය යුතු වුවත් එසේ නොයවා සම්පූර්ණ වැටුපම නිලධාරියාට ගෙවා තිබුණි. |
| (ii) VIII පරිච්ඡේදයේ 10.1, 10.2 වගන්ති | මාණ්ඩලික නිලධාරියකු සති අන්තයේ හෝ රජයේ නිවාඩු දිනයක සේවයේ යොදවා ගැනීමට පෙර පූර්ව අනුමැතියක් ලබා ගත යුතු වුවත්, එවැනි නිසි අනුමැතියකින් තොරව අවස්ථා 16 කදී නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා රු.35,004 ක් වැය කර තිබුණි. |
| (iii) XIV පරිච්ඡේදයේ 1.3 වගන්තිය | ක්ෂේත්‍ර රාජකාරි වල නිරත වීමේදී ඒ සඳහා නවාතැන්, ආහාර පාන සඳහා මුදල් ලබා ගෙන තිබූ අතර එම ගමන් වෙනුවෙන් සංයුක්ත දීමනාද ලබා ගෙන තිබුණි. නියැදි පරීක්ෂාවක ට අනුව ආහාර පාන සඳහා රු.290,744 ක ද, සංයුක්ත දීමනා වශයෙන් රු.44,662 ක් ද ලබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. |
| (iv) XXIV පරිච්ඡේදයේ 4.8 වගන්තිය | 2009 සැප්තැම්බර් 30 දින හා 2010 පෙබරවාරි 01 දින සේවයෙන් ඉල්ලා අස්වී ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.736,393 ක දේපල ණය ශේෂ අයකර ගැනීමකින් තොරව 2010 සැප්තැම්බර් 30 හා 2010 පෙබරවාරි 02 දිනයන්හි අධිකාරිය විසින් මෙම නිලධාරීන්ට සේවක පාරිතෝෂික මුදල් වශයෙන් රු.189,545 ක් ගෙවා |

තිබුණි. රජයට අයවිය යුතු මුදල් අය නොකර පාර්තොෂික නිදහස් කරන ලද නිලධාරීන් සම්බන්ධව කිසිදු පියවරක් අධිකාරිය විසින් ගෙන නොතිබුනි.

(ඊ) 1997 ජනවාරි 15 දිනැති අංක 2/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 6 වගන්තිය

ආයතනය විසින් මුදල් රෙගුලාසි හෝ අතිකාල පාලන රෙගුලාසි සම්මත කර ගෙන නොතිබියදීත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අභිබවා පැයකට පැය 1 1/2 ක අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි.

(උ) <u>ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි</u> මු.රෙ. 756 (2) ( අ )

සමීක්ෂණ මණ්ඩලයේ සංයුතිය ලෙස වගකිව යුතු නිලධාරීන් දෙදෙනෙකු පත් කල යුතු වුවත් එසේ සිදු නොකර මිලදී ගැනීම් භාරව සිටින නිලධාරීන්ද භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට සහභාගී කරවාගෙන තිබුණි. භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට යොදවා තිබූ ආයතනයේම නිලධාරීන් 04 දෙනෙකුට විධිමත් අනුමැතියකින් තොරව රු.12,000 ක මුදලක් ද ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.2,137,985 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.12,389,558 ක් වූයෙන් මූල්‍ය පතිඵල වල රු.10,251,573 ක පිරිහීමක් දක්නට ලැබුණි. ආදායම් රු.45,467,575 කන් අඩුවීම හා පෞද්ගලික පඩිනඩි රු.2,134,820 කන් ද, වන්දි ගෙවීම් හා සුභසාධන කටයුතු රු.32,852,099 කනද ලෙස වියදම් අඩුවීමද මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව නිරීක්ෂණය විය.

#### 2.1.2 මතභේදයට තුඩුදෙන කරුණ

අනුමත සේවක සංඛ්‍යාවෙන් බාහිරව සම්බන්ධීකරණ නිලධාරි තනතුර සඳහා 2010 වර්ෂය තුල 11 දෙනෙකු සේවයේ යොදවා තිබූ අතර, ඒ සඳහා රු.773,916 ක වැටුප් ගෙවා තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුල අධිකාරිය විසින් කරන ලද කටයුතු වල කාර්ය සාධනය පහත පරිදි විය.

| වැඩ සටහන | ඇස්තමේන්තු ගත මුදල | තථ්‍ය වියදම | විචලනය | ඇස්තමේන්තු ගත අවස්ථා | තථ්‍ය අවස්ථා | විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | | |
| 1. සාමාන්‍ය මහජන මරණ හා තුවාල වන්දි ගෙවීම් | 208,754,400 | 48,964,500 | 159,789,900 | 2758 | 638 | 2120 |
| 2. රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථා සේවක මරණ හා තුවාල වන්දි ගෙවීම | 11,535,750 | 2,345,000 | 9,190,750 | 116 | 19 | 97 |
| 3. රාජ්‍ය සේවක දේපල වන්දි ගෙවීම | 40,595,000 | 39,155,411 | 1,439,589 | 341 | 398 | (57) |
| 4. හානියට පත් පූජනීය ස්ථාන වෙනුවෙන් වන්දි ගෙවීම | 10,900,000 | 665,740 | 10,234,260 | 41 | 9 | 32 |
| 5. සාමාන්‍ය මහජන දේපල වන්දි ගෙවීම | 27,190,000 | 25,126,893 | 2,063,107 | 322 | 332 | (10) |
| 6. අවතැන්වූ ජනතාව වෙනුවෙන් විවාහ සමෘද්ධි නිවාස ආධාර ගෙවීම | 39,750,000 | 6,675,000 | 33,075,000 | 1590 | 524 | 1066 |
| 7. විශේෂ ගනයේ පුද්ගලයන් සඳහා දේපල වන්දි ගෙවීම | 2,850,000 | 597,500 | 2,252,500 | 19 | 6 | 13 |
| 8. ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නිවාස ආධාර ගෙවීම | 126,450,000 | 85,000,000 | 41,450,000 | 1404 | 2087 | (683) |
| 9. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් සිදුවූ මරණ හා තුවාල වෙනුවෙන් වන්දි ගෙවීම | 10,617,250 | - | 10,617,250 | 354 | - | 354 |
| 10. මැතවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් විනාශ වූ දේපල සඳහා වන්දි ගෙවීම | 100,000,000 | - | 100,000,000 | 2208 | - | 2208 |
| 11. ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ජීවනාධාර ගෙවීම | 41,250,000 | - | 41,250,000 | 1250 | - | 1250 |

2.2.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

අධිකාරිය විසින් 1990 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණය පහසුකම් සැලසීම උදෙසා සිදුකරන ලද රු.128,000,000 ක ආයෝජන සඳහා වසර 3 කට අදාලව රු.30,720,000 ක පොළී අයවී නොතිබුනි.

2.2.3 <u>අයවැය ලේඛනමය පාලනය</u>

ඇස්තමේන්තු ගත හා තථ්‍ය ආදායම සහ වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ඒකාබද්ධ සහනාධාර ණය යෝජනා ක්‍රමය

(ඇ) වන්දි ගෙවීම

(ඇ) නිවාස අධාර ව්‍යාපෘති